කොවිඩ්-19 සම්බන්ධයෙන් වන මාධ්‍ය වාර්තාකරණයන් හිදී ඒ සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්ම නිර්දේශයන්ට අනුගත වීමේ වැදගත්කම, කොවිඩ්-19 වාර්තාකරණය තුළ ආසාදිතයින් සමාජය තුළ කොන් කිරීමකට ලක් නොකරන, ඔවුන් සම්බන්ධයෙන් ගර්හාත්මක ආකල්පයක් ඇති නොකරන භාෂා භාවිතයක වැදගත්කම අපි නිරන්තරයෙන්ම පෙන්වා දී ඇත්තෙමු. කෙසේ වෙතත්, තවමත් ශ්‍රී ලංකාවේ ඇතැම් මාධ්‍ය එම ආචාර ධාර්මික වාර්තාකරණය වෙත අනුගත වී නොතිබීම කනගාටුවට කරුණකි.

මෙයට උදාහරණ ලෙසින් අරුණ පුවත්පතේ "බුලත්කොහුපිටියේ කොරෝනා මාළු වෙළඳුන්ගේ වර්ධනයක්" යනුවෙන් වූ සිරස්තලයත්, ලංකාදීප පුවත්පතේ "කොරෝනා රාලහාමි" යනුවෙන් වන සඳහනත් දැක්විය හැක.
යම් පුද්ගලයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වීම කෙසේවත් එම පුද්ගලයාගේ වරදක් නොවේ. එසේ නම්, මෙවැනි යෙදුම් දිගින් දිගටම භාවිතා කරන්නේ මන්ද? ඒ ඔස්සේ ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇති නොකෙරෙන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Lankadeepa #Aruna**